ධීවර අමාත්‍යාංශය

විසිතුරු මසුන්, මිරිදිය මත්ස්‍ය හා ඉස්සන් ඇති කිරීම, ධීවර වරාය සංවර්ධන, බහුදින ධීවර කටයුතු හා මත්ස්‍ය අපනයන රාජ්‍ය අමාත්‍යාංශය

# ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය

# පුරප්පාඩු

අවශ්‍ය සුදුසුකම් සහ පළපුරුද්ද සහිත ශ්‍රී ලංකා පුරවැසියන්ගෙන් පහත තනතුර සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ.

**(1) තනතුර: අධ්‍යක්ෂ (වෙරළබඩ ජලජීවී වගා සංවර්ධන) - HM 1 - 1 - ප්‍රධාන කාර්යාලය**

**සුදුසුකම් සහ පළපුරුද්ද - බාහිර**

(a) විද්‍යාවේ දී ජීව විද්‍යාව හෝ සත්ව විද්‍යාව පිළිබඳ විශේෂ උපාධිය හෝ ජල ජීවී වගාව/ ධීවර කටයුතු හෝ විද්‍යාවේ දී ආහාර විද්‍යාව සහ පෝෂණය කෘෂිකර්මය/ පශු වෛද්‍ය පිළිබඳව විශ්ව විද්‍යාල කොමිෂන් සභාව පිළිගත් උපාධියක් ලබා තිබීම.

සහ

(b) විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව පිළිගත් ජල ජීවී වගාව/ධීවර කටයුතු පිළිබඳ විද්‍යාපති/ දර්ශණපති උපාධියක් සමග කළමනාකරණ තලයේ වසර 15ක සංස්ථාවක, ව්‍යවස්ථාපිත මණ්ඩලයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක පළපුරුද්දක් ලබා තිබීම.

**සුදුසුකම් සහ පළපුරුද්ද - අභ්‍යන්තර**

(a) ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරියේ ජල ජීවී වගාව/ මිරිදිය/ වෙරළබඩ, විතාප්ති සේවා තුළ කළමනාකරණ ගණයේ (MM) 1 ශ්‍රේණියේ තනතුරක අවම වශයෙන් වසර පහක (05) කාලයක් සේවය කර තිබීම.

**වැටුප් පරිමාණය : HM 1-1-2016 : රු: 81,670 - 15 × 2,270 - 115,720**

**පොදු කොන්දේසි :**

- රජයේ/ පළාත් පාලන දෙපාර්තමේන්තුවක/ සංස්ථාවක/ ව්‍යවස්ථාපිත මණ්ඩලවල සේවය කරන අයදුම්කරුවන් තම අයදුම්පත්‍ර අදාල ආයතන ප්‍රධානීන් මගින් ඉදිරිපත් කළ යුතු ය.
- අයදුම්කරු ශ්‍රී ලංකාවේ පුරවැසියකු විය යුතු ය.
- තනතුරේ රාජකාරි ඉටු කිරීමට සහ දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට ශාරීරිකව හා මානසිකව යෝග්‍ය විය යුතු ය.
- අවුරුදු 35 ට නොඅඩු අවුරුදු 55 ට නොවැඩි අයදුම්කරුවන් විය යුතුය. අභ්‍යන්තර අපේක්ෂකයන් සඳහා උපරිම වයස් සීමාව අදාළ නොවේ.
- අයදුම්කරුවන් උසස් චරිතයකින් විය යුතු ය.
- පත්වීම ස්ථිර පදනමින් සිදු කෙරේ.

**ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය විසින් ලබා දෙන අනෙක් ප්‍රතිලාභ**

- වෛද්‍ය ප්‍රතිලාභ
- රජය මගින් අනුමත කර ඇති අනෙකුත් වෘත්තීය දීමනා ගෙවනු ලැබේ.
- දැනට පවතින රාජ්‍ය ව්‍යවසාය චක්‍රලේඛවලට අනුව අධිකාරිය විසින් රියදුරු හා ඉන්ධන දීමනාව සහිත වාහනයක් හෝ ප්‍රවාහන දීමනාවක් ගෙවනු ලැබේ.
- සේවක අර්ථසාධක අරමුදල් සහ සේවක භාර අරමුදලේ දායකත්වය

**ඉහත සඳහන් තනතුර සඳහා ඔබගේ අයදුම්පත් එවන විට පහත තොරතුරු ඉදිරිපත් කළ යුතුය.**

- ජීව දත්ත පත්‍රය
- සුදුසුකම් සහ පළපුරුද්ද සනාථ කිරීම සඳහා සහතිකවල සහතික කළ ඡායා පිටපත්.

සම්පූර්ණ තොරතුරු ඇතුළත් අයදුම්පත්, අයදුම් කරන තනතුර ලියුම් කවරයේ ඉහළ වම් කෙළවරේ සඳහන් කර ලියාපදිංචි තැපෑල හරහා **"සභාපති, ශ්‍රී ලංකා ජලජීවී වගා සංවර්ධන අධිකාරිය, අංක 41/1, නව පාර්ලිමේන්තු පාර, පැලවත්ත, බත්තරමුල්ල"** යන ලිපිනයට මෙම දැන්වීම පළ කර **දින 14 ක්** ගතවන දින හෝ එදිනට පෙර එවිය යුතු ය.

**සභාපති**

**ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය.**

2022.01.19